අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk

මගේ අංකය : PTF/01/Letter/02

දිනය : 2020.03.27

**සභාපති**

මධ්‍යම පරිසර අධිකාරිය

**<u>පරිසර නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීම</u>**

කොරෝනා වෛරසය (COVID – 19) ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම සඳහා මේ වන විට රජය විසින් ගෙන යනු ලබන ජාතික වැඩපිළිවෙළට සහාය ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතනවල ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල යෙදවිය හැකි කාර්ය මණ්ඩලයේ සේවය ලබා ගැනීමට, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 33වන ව්‍යවස්ථාව මඟින් අතිගරු ජනාධිපතිතුමා වෙත පැවරී ඇති බලතල අනුව නිකුත් කරන ලද අංක 2168/8 හා 2020 මාර්තු 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කොට ඇති ජනාධිපති විධානය ප්‍රකාරව පත් කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකාය විසින් තීරණය කරනු ලැබ ඇත.

02. ඒ අනුව, දැනට පවතින ව්‍යවසනකාරී තත්වය පහව යන තුරු, මධ්‍යම පරිසර අධිකාරියේ සියලු ම පරිසර නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් කොරෝනා වෛරසය (COVID – 19) ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමට ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා දායක කර ගැනීමේ අරමුණ ඇතිව, එක් එක් නිලධාරියාට ආසන්න ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත, වහාම ක්‍රියාත්මක වන පරිදි අනුයුක්ත කිරීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

**ඇන්ටන් පෙරේරා**
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
ලේකම් - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම,
සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

පිටපත්:

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
03. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

} කාරුණික දැන ගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

දුරකථන / தொலைபேசி / Telephones: 2575317 - 18, 2370737 - 38
ෆැක්ස් / தொலைநகல் / Fax: 2575310, 2574713
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: secpm@pmoffice.gov.lk, Info@pmoffice.gov.lk